**බළන්ගොඩ නගර සභාව**

**2019-10-18 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව**

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2019.10.18**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළු දෙනා පිළිගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. 2020 වර්ෂයට අදාලව සහා දේපල ටෙන්ඩර් කිරීම සඳහා ටෙන්ඩර් පත් විවෘත කිරීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බැවින් ඒ සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කර ගන්නා ලදී.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද පහත සඳහන් තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් නැවත වරක් සභාවට ඉදිරිපත් කරන ලදී.

- 2020 වර්ෂය සඳහා මහජන පොළ ආපන ශාලාව සඳහා ලංසුපත් තුනක් නිකුත් කළ අතර එම ලංසු පත් තුනම ලැබී තිබුණි. ඉන් වැඩිම ලංසුව රාස්සගල, බළන්ගොඩ ලිපිනයෙහි පංදිචි ගුරුගේ රංග ප්‍රදීප් ජයතිලක මහතා විසින් ඉදිරිපත් කර තිබූ නමුත් ටෙන්ඩර් අයදුම්පතේ අංක 03 කොන්දේසිය කඩ කිරීම හා අනු පිටපත නොමැතිවීම හේතුවෙන් එම අයදුම්පත ප්‍රතික්ෂේප කරන ලදී. එම නිසා ඊළඟ වැඩිම ලංසු මුදල ලෙස රු.8015.00 ක් ඉදිරිපත් කර තිබූ උඩ ඇල්ලෙපොල, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි එම්. ජී.ගුණදාස යන අයගේ ලංසුව පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

- නව බස්නැවතුම්පල D/11/1 කඩ කාමරය සඳහා ලංසුපත් පහක් නිකුත් කර තිබූ අතර එම ලංසුපත් පහම ලැබී තිබුණි. එහිදී වැඩිම ලංසුව ලෙස බළන්ගොඩ, රාස්සගල පාරේ පදිංචි එම්.කේ. ධනංජය මුළුතියනගේ මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු.15200.00 ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

- 2020 වර්ෂය සඳහා බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීම සඳහා එක් ලංසුපතක් නිකුත් කර තිබූ අතර එම ලංසුපත ලැබී තිබුණි. එහි ලංසුව ලෙස අනඳමෙත්ගම පාර, කිරිඳිගල, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි තල්පේ අහංගමගේ චමීර මලිත් නිශාන්ත මහතා රු.145,090.00 මුදලක් දක්වා තිබූ අතර එම ලංසුව පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

- 2020 වර්ෂය සඳහා බළන්ගොඩ බස් නැවතුම්පල පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම සඳහා එක් ලංසුපතක් නිකුත් කර තිබූ අතර එම ලංසුපත ලැබී තිබුණි. එහි ලංසු මුදල ලෙස රු.110,300.00ක මුදලක් දක්වා තිබූ සරස්වතී පාර, උඩ ඇල්ලෙපොල පදිංචි එම්.උදය ශාන්ත මහතාගේ ලංසුව පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

- පොදු වෙළෙඳසැල අංක 03 දරණ කඩ කාමරය සඳහා ලංසුපත් දෙකක් නිකුත් කර තිබූ අතර ලංසුපත් දෙකම ලැබී තිබුණි. එහිදී වැඩිම ලංසුව ඉදිරිපත් කර තිබූ අංක 34, රාස්සගල පාර, තුඹගොඩ, බලන්ගොඩ ලිපිනයෙහි පදිංචි ශ්‍රී කාන්දන් ශ්‍රී ගෝපිනාත් මහතාගේ රු.9,810.00 ක ලංසු මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

- 2020 වර්ෂය සඳහා පොදු වෙළෙඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය සඳහා එක් ටෙන්ඩර්පතක් නිකුත් කර තිබූ අතර එම ලංසුපත ලැබී තිබුණි. එහිදී එම්.එන්.එම්.රිස්මි මහතා ඉදිරිපත් කර තිබූ රු.8,750.00 ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

- 2020 වර්ෂය සඳහා පොදු වෙළෙඳසැල අංක 17 දරණ කුකුල් මස් කඩ කාමරය හා 2020 වර්ෂය සඳහා මහජන පොළ හා බස් නැවතුම්පළ පොදු වැසිකිළි වෙනුවෙන් කිසිදු ලංසුපතක් නිකුත් නොවූ අතර ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ගය මහ සභාව මඟින් තීරණය කිරීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉහතින් ලබා ගන්නා තීරණ සියල්ල ගරු සභාපතිතුමා විසින් නැවත සභාවට ඉදිරිපත් කරමින් සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මහජන පොළ ආපන ශාලාව සඳහා ලද ප්‍රතික්ෂේප වූ අයදුම්පත සඳහා නැවත ඇප මුදල් නිදහස් කරන්නේදැයි විමසා සිටි අතර එහිදී ගරු සභාපතිතුමන් විසින් ටෙන්ඩර් කොන්දේසි වලට අනුකූලව හැකියාවක් තිබේනම් ගෙවන බව පවසන ලදී.

**2020 වර්ෂය සඳහා පොදු වෙළෙඳසැල අංක 17 දරන කුකුල් මස් කඩ කාමරය නැවත වරක් ටෙන්ඩර් කිරීම.**

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා පොදු වෙළෙඳසැලෙන් පිටත විවෘත ස්ථාන වල කුකුල් මස් කඩ වැඩි වශයෙන් පවත්වාගෙන යාම හේතුවෙන් මෙම කඩ කාමරයට පාඩු සිදුවන බව සඳහන් කරන ලදී. එමෙන්ම මෙම කඩ කාමරය වැඩි මුදලකට ටෙන්ඩර් නොවන බැවින් මිල අඩු කර ලබා දීම හෝ එසේ නොමැතිනම් පොදු වෙළෙඳසැලෙන් පිටත විවෘත ස්ථානවල පවත්වාගෙන යන කඩ කාමර ඉවත් කිරීම සිදු කළ යුතු බවත් පැවසීය.

එම්.එන්.එම්.රිස්මි ෆලීල් මහතා විසින් පොදු වෙළෙඳසැල කුකුල්මස් කඩ කාමරයේ කුලී මුදල අඩු කර ටෙන්ඩර් කරන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

2019.09.10 දින 04ඃ01ඃ02 තීරණය යටතේ පවත්නා මිලට 10% ක මුදලක් වැඩිකරමින් කුකුල් මස් කඩ කාමරය සඳහා ටෙන්ඩර් පත් කැඳවනු ලැබුවද ඒ සඳහා එක් ලංසුපතක් හෝ නිකුත් නොවූ බැවින් මෙවර ලංසුපත් කැඳවූ මුදලින් 25% ක මුදලක් අඩුකර නැවත වරක් ලංසුපත් කැඳවීම සුදුසු බවට කල යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**2020 වර්ෂය සඳහා මහජන පොළ හා බස් නැවතුම්පළ පොදු වැසිකිළි සඳහා ටෙන්ඩර් පත් කැඳවීම.**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් බස් නැවතුම්පල වැසිකිලි පද්ධතිය අලුත්වැඩියා කර ලබා දෙන ලෙස පවසන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පොදු වැසිකිළි වල විදුලි බිල් හා ජල බිල් අදාළ ටෙන්ඩර්කරුටම ගෙවීමට ලබා දෙන අතර ඒ සඳහා වෙනම මීටර් යොදා සකස් කර ලබා දෙන බවත්, මෙවර මෙම ටෙන්ඩරය සඳහා කිසිවෙකු ලංසු පත් ඉදිරිපත් කර නොමැත්තේ මෙහි පවතින පැටලිලි සහගත බව නිසා බව පවසන ලදී. එසේ නොමැතිව විදුලි බිල් හා ජල බිල් ගෙවීම සභාව මඟින් සිදු කළහොත් ඔවුන් කිසිදු පාලනයකින් තොරව ජලය භාවිත කරන බැවින් විශාල ජල බිලක් සභාවට දැරීමට සිදු වන බව වැඩිදුරටත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් සභාවේ කම්කරුවන් යොදා මෙම කාර්යය ඉටු කිරීම සුදුසු බව පවසන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් දැනට වෙනම ජල මීටරයක් සවි කර නොමැති බැවින් ඒ සඳහා වෙනම මීටරයක් සවිකර මාසයක පමණ කාලයක් එහි බිල කෙසේදැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුව ටෙන්ඩර්පත් නිකුත් කළ යුතු බව යෝජනා කළ අතර එසේ නොමැති වුවහොත් ටෙන්ඩර්කරු ජල බිල අඩු කර ගැනීමේ අරමුණින් වැසිකිළි පවා අපිරිසිදුව තබා ගත හැකි බව පවසන ලදී.

ගරු සභාපතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙවර ඉදිරිපත් කළ ලංසු මුදල අවම ලංසුව වශයෙන් ඉදිරිපත් කිරීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

අද දින සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබා දුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුද කරමින් ප.ව.12.00 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

චමික ජයමිණ විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව